ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I, II | කාලය: පැය 03 යි. |
|---|---|---|

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## I කොටස

**උපදෙස් :**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.

01. ග්‍රීසියේ පැවති පුරවැසි සභාවේ පාලන කටයුතු සඳහා සහභාගී වූයේ,
    1. නගරවැසි පුරවැසියන්
    2. නගරවැසි කාන්තාවන්
    3. වහලුන්
    4. විදේශිකයන්

02. ඉන්දියාවේ "වජ්ජි" ජනපදයේ සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවතියේ,
    1. ක්‍රි.පූ. 5වන සියවසේ
    2. ක්‍රි.පූ. 6වන සියවසේ
    3. ක්‍රි.ව. 4වන සියවසේ
    4. ක්‍රි.ව. 3වන සියවසේ

03. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු ගුණාංගයක් නොවන්නේ මින් කුමක් ද?
    1. සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම
    2. විරුද්ධ මත ඉවසීම
    3. බහුතර මතයට ගරු කිරීම
    4. අයිතිවාසිකම් පමණක් භුක්ති විඳීම.

04. මේ අතරින් උඩරට නීතියට අයත් නොවන්නේ කුමක් ද?
    1. විවාහය
    2. දික්කසාදය
    3. දේපළ උරුමය
    4. භූමියේ චාරිත්‍ර ඉටු කිරීම

05. ලන්දේසි යුගයේ දී පැවති ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්කයක් නොවන්නේ,
    1. කොළඹ
    2. මහනුවර
    3. යාපනය
    4. ගාල්ල

06. අභියාචනාධිකරණයේ විනිසුරුවන් පත් කිරීමේ බලය ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත,
    1. ජනාධිපති සතු ය.
    2. අධිකරණ ඇමති සතු ය.
    3. අග්‍ර විනිශ්වයකාරතුමා සතු ය.
    4. නීතිපතිතුමා සතු ය.

07. මෙරට පැරණි සිංහල අධිකරණ ක්‍රමයම පවත්වාගෙන යනු ලැබුවේ,
    1. පෘතුගීසීන්
    2. ලන්දේසීන්
    3. ඉංග්‍රීසීන්
    4. බ්‍රිතාන්‍යයන්

08. ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක්වී පිහිටුවා ගත් සංවිධානය රා ලෙස ප්‍රකාශ කළේ,
    1. මැකියාවෙලි
    2. බොඩෑන්
    3. ඇරිස්ටෝටල්
    4. හොබ්ස්



CS CamScanner

09. මෙ අතරින් ඒකීය රාජ්‍යයක් නොවන්නේ,

1. ශ්‍රී ලංකාව 2. මහා බ්‍රිතාන්‍යය 3. ප්‍රංශය 4. ඇමරිකාව

10. ශ්‍රී ලංකාවට පළාත්සභා ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන සංශෝධනය මගින් ද?

1. 12 වන සංශෝදනය 2. 13 වන සංශෝධනය
3. 16 වන සංශෝධනය 4. 17 වන සංශෝධනය

11. පළාත් සභාවක මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු කාර්යයක් වන්නේ,

1. පළාත් අයවැය ලේඛනය සැකසීම
2. පළාත් සභාව කැඳවීම
3. පළාත් සභා ප්‍රඥප්තිය අනුමත කිරීම
4. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතර සම්බන්ධය පවත්වා ගැනීම.

12. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල වන්නේ,

1. අධ්‍යාපනය 2. සෞඛ්‍ය 3. මූල්‍ය කටයුතු 4. පළාත් පාලනය

13. පහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතරින් ශ්‍රී ලාංකිකයන්ට පළමු වරට ඡන්ද බලය හිමි වූ ආණ්ඩුක්‍රමය වන්නේ,

1. 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය මගින් 2. 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය මගින්
3. 1921 මැනිං ආණ්ඩුක්රමය මගින් 4. 1931 ඩොනමෝර් ආණ්ඩුක්රමය මගින්

14. පහත සඳහන් කරුණු අතරින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ලැබෙන්නේ,

1. සර්වජන ඡන්දබලය 2. පළාත්බද නියෝජනය
3. විධායක කාරක සභා ක්රමය 4. සෙනෙට් සභාව

15. මධ්‍යම පළාත්ට අයත් දිස්ත්‍රික්කයක් වන්නේ,

1. බදුල්ල 2. මොනරාගල 3. මාතලේ 4. කෑගල්ල

16. ශ්‍රී ලංකාවේ පළාත් පාළන ආයතනවලට පැවරී ඇති කාර්ය ප්‍රධාන තේමා තුනකින් දැක්වේ. ඊට අයත් නොවන තේමාව වන්නේ,

1. පොදු මංමාවත් 2. මහජන සෞඛ්‍ය 3. ආරක්ෂක කටයුතු 4. පොදු උපයෝගීතාවන්

17. ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත් කිරීමට අඩුම දායකත්වය ◌ැසපයන්නේ,

1. ආගම 2. ගෝලීයකරණය 3. සන්නිවේදනය 4. සංචාරක ව්‍යාපාරය

18. මෙ අතරින් සංක්‍රමණික කණ්ඩායමක් වන්නේ,

1. පඩුවස්දෙව් ඇතුළු පිරිස 2. පණ්ඩු පාරින්ද ඇතුළු පිරිස
3. බටහිර යුරෝපා ජාතීන් 4. සේන ගුත්තික ඇතුළු පිරිස

19. පළමුවන ලෝක මහා සංග්‍රාමය පැවතියේ,

1. 1912 – 1916 අතර කාලයේදී ය. 2. 1914 – 1918 අතර කැලයේදී ය.
3. 1929 – 1935 අතර කාලයේදී ය. 4. 1939 – 1945 අතර කාලයේදී ය.

20. ලෝක කම්කරු සංවිධානය විසින් 1989 දී පිහිට වූ සම්මුතිය මගින් අයිතිවාසිකම් ආරක්ෂා වූයේ,

1. කම්කරු ජනතාවගේ 2. ආදිවාසී ගෝත්‍රිකයන්ගේ
3. කාන්තාවන්ගේ 4. ජ්‍යෙෂ්ට පුරවැසියන්ගේ



CamScanner

21. 1980 දී සම්මත කරන ලද ජාතික පාරිසරික පනතට අනුව මෙරට ක්‍රියාත්මක කේන්ද්‍රීය ආයතනය වන්නේ,

1. පරිසර අමාත්‍යාංශය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. මධ්‍යම පරිසර අධිකාරිය
4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

22. පුද්ගලයකු උපතත් සමඟ සාමාජිකත්වය ලබන සමාජ ඒකකය වන්නේ,

1. පාසල
2. ආගමික ස්ථාන
3. සමාජික කණ්ඩායම
4. පවුල

23. එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කරන ලද්දේ,

1. ක්‍රි.ව. 1940 දීය.
2. ක්‍රි.ව. 1945 දී ය.
3. ක්‍රි.ව. 1948 දී ය.
4. ක්‍රි.ව. 1951 දී ය.

24. "වෙනස්කම් තුළින් එකමුතු බව" තේමා කරගත් රටකි,

1. ස්විස්ටර්ලන්තය
2. ඇමරිකාව
3. ඕස්ට්‍රේලියාව
4. කැනඩාව

25. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වන වයස් සීමාව වනුයේ,

1. අවු. 50 – 55
2. අවු. 50 – 60
3. අවු. 55 - 60
4. අවු. 52 – 57

26. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් පමණක් මෙරට ක්‍රියාත්මක ආයතනයක් නොවන්නේ,

1. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය
2. පොලිස් දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. සමුද්‍රීය පරිසර ආරක්ෂක දෙපාර්තමේන්තුව

27. වායු දූෂණය මගින් ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් නොවන්නේ,

1. හිම කඳු දියවීම
2. දේශගුණික විපර්යාස ඇති වීම
3. අම්ලවැසි ඇති වීම
4. මුහුදු ජල මට්ටම පහත යාම

28. භෞතික ජීවනතත්ත්ව දර්ශකය සකස් කිරීමට යොදා සංරචකයකි,

1. දළ ජාතික නිෂ්පාදිතය
2. මානව දරිද්‍රතා දර්ශකය
3. ළදරු මරණ අනුපාතිකය
4. ආර්ථික වර්ධන වේගය

29. සංවර්ධිත රටවල් සඳහා නිදසුනකි,

1. ඉන්දියාව
2. බ්‍රසීලය
3. බෙල්ජියම
4. තායිලන්තය

30. දිළිඳු බවේ විෂම චක්‍රයට අයත් නොවන කරුණකි,

1. ඉහළ ආදායම
2. ඉහළ පරිභෝජන වියදම
3. ඉතුරුම් අඩුවීම
4. ප්‍රාග්ධනය අඩුවීම

31. ගැටුම් නිරාකරණය කිරීමට යොදා ගන්නා සාම්ප්‍රදායික ක්‍රමයක් වනුයේ,

1. බේරුම් කිරීම
2. උපදේශනය
3. විනිසීම
4. සාකච්ඡා කිරීම

32. සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර වෘත්තීය ගැටළු විසඳීමට යොදාගන්නා ක්‍රමවේදය වනුයේ,

1. මැදිහත්කරණය
2. බේරුම්කරණය
3. සමථකරණය
4. සහමන්ත්‍රණය හා කෝවල් කිරීම

33. ප්‍රාග්ධනය සඳහා කරන ගෙවීම් හඳුන්වයේ,

1. වැටුප
2. පොළිය
3. ලාභය
4. බදු කුලිය

34. මේ අතරින් ප්‍රාග්ධන භාණ්ඩයක් නොවනුයේ,

1. යන්ත්‍රසූත්‍ර
2. ඇඳුම්පැළඳුම්
3. ගොඩනැගිලි
4. වාහන

35. ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සමාජික රටක් නොවන්නේ,

1. චීනය
2. ඇමරිකාව
3. ප්‍රංශය
4. ඕස්ට්‍රේලියාව



CamScanner

36. විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් නොවන්නේ,

1. ගැට් සංවිධානය
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
3. උන්ක්ටාඩ් සංවිධානය
4. අන්තර්ජාතික කම්කරු සංවිධානය

37. මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍යය මූලික අවශ්‍යතාවයක් නොවන්නේ,

1. ඇඳුම්පැළඳුම්
2. යානවාහන
3. ආහාර
4. නිවාස

38. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ,

1. එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක්
2. භූමිය, ජනගහණය, ආරක්ෂාව යන අංගයන්ගෙන් සමන්විත වීම.
3. වෘත්තිය නිලබල පැලැන්තියක් මඟින් පාලනය වීම.
4. අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධ ස්වාධිපත්‍ය බලය හිමි වීම.

39. පහත සඳහන් තනතුරු අතර රාජ්‍ය නිලධාරියකු වන්නේ,

1. මහ ඇමති
2. නාගරික කොමසාරිස්
3. නගරාධිපති
4. ප්‍රාදේශීය සභා සභාපති

40. සමාජ පරිසරයට හානි ඇතිවීම නිසා සිදු නොවන ප්‍රතිඵලයකි,

1. සමාජ සබඳතා බිඳවැටීම
2. සමාජ අසාධාරණකම් සිදුවීම
3. දෙමාපිය දූදරු සබඳතා බිඳවැටීම
4. පවුල් සංස්ථා ගොඩනැගීම

(ලකුණු 1 x 40 = 40)



CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - II | |
|---|---|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. I. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
II. ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් ලියන්න.
III. ශ්‍රී ලංකාව බහුසංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් ලියන්න.
IV. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙකක් ලියන්න.
V. අන්තර් ජාතික ගැටුම්වල ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
VI. නීතිය ක්‍රියාත්මකවන ආකාරය අනුව ප්‍රධාන කොටස් දෙකකි. නම් කරන්න.
VII. වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන පළාත් පාලන ආයතන තුනකි. ඉන් දෙකක් නම් කරන්න.
VIII. පරිසරයෙන් ලැබෙන සේවා දෙකක් ලියන්න.
IX. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
X. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විශේෂ අරමුණු හතරෙන් දෙකක් නම් කරන්න.

(ල. 2 x 10 = 20)

02. I. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග දෙකක් නම් කරන්න. (ල. 2)
II. සංස්කෘතිය යන්නට නිර්වචන ඉදිරිපත්කල සමාජ විද්‍යාඥයින්, දාර්ශනිකයන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)
III. බහු සංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත්ව ජීවත් වීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

03. I. සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයන් දෙකක් ලියන්න. (ල.2)
II. 3R සංකල්පය නම් කරන්න. (ල. 3)
III. (A) තිරසාර සංවර්ධනය ලඟා කර ගැනීමේ දී ජයගත යුතු ප්‍රධාන අංශ තුන නම් කරන්න.(ල.3)
(B) ඉහත පරිසර සංවර්ධනය සිදුකල යුතු ආකාරය කෙටියෙන් පහදන්න. (ල. 2)

04. I. ගැටුම් ඇති විය හැකි පාර්ශව දෙකක් නම් කරන්න. (ල. 2)
II. ගැටුම් ඇති විය හැකි මූලයන් තුනක් නම් කරන්න. (ල. 3)
III. (A) එකඟත්වයෙන් ගැටුම් විසදා ගත හැකි අවස්ථා තුනක් නම් කරන්න. (ල. 3)
(B) ගැටුම් නිරාකරණයේ දී යොදා ගන්නා උපදේශනය කෙටියෙන් පැහදිලි කරන්න. (ල. 2)



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ] Scanner

05. I. ද්වි පක්ෂ රටාවක් දැකිය හැකි රාජ්‍යයන් දෙකක් නම කරන්න. (ල. 2)

II. එංගලන්තය, ප්‍රංශය, ඕලන්දය, පෘතුගාලය වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍යයන් ලෙස නැගී සිටීමට හේතු වූ කරුණු තුනක් ලියන්න. (ල.3)

III. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට බලපාන සාධක රාශියකි. ඉන් තුනක් නම කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

06. I. මිනිස් වුවමනා ඉටුකර ගැනීමේ දී විවිධ භාණ්ඩ හා සේවා යොදා ගනු ලැබේ. එම භාණ්ඩ ප්‍රධාන කොටස් දෙකට බෙදේ. එය නම කරන්න. (ල. 2)

II. සමාජවාදී ආර්ථිකයක මූලික ලක්ෂණ තුනක් නම කරන්න. (ල. 3)

III. (A) නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව කොටස් තුනකට බෙදේ. එය නම කරන්න. (ල. 3)

(B) 1961 – 1970 අතර කාලයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් නම කරන්න. (ල. 2)

07. I. වායු දූෂණය වන ස්වභාවික ක්‍රම දෙකක් නම කරන්න. (ල. 2)

II. සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලු තුනක් ලියන්න. (ල. 3)

III. මිනිසා මූලික වීමෙන් සිදු වී ඇති පාරිසරික ගැටලු තුනක් නම කර, එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)



WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ] Scanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**පුරවැසි අධ්‍යාපනය - 11 ශ්‍රේණිය - 2024(2025)**

**පිළිතුරු පත්‍රය**

---

**1 පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 01. 1 | 11. 1 | 21. 3 | 31. 3 |
| 02. 2 | 12. 3 | 22. 4 | 32. 4 |
| 03. 4 | 13. 2 | 23. 2 | 33. 2 |
| 04. 4 | 14. 4 | 24. 1 | 34. 2 |
| 05. 2 | 15. 3 | 25. 3 | 35. 4 |
| 06. 1 | 16. 3 | 26. 2 | 36. 4 |
| 07. 1 | 17. 1 | 27. 4 | 37. 2 |
| 08. 3 | 18. 1 | 28. 3 | 38. 2 |
| 09. 4 | 19. 2 | 29. 3 | 39. 2 |
| 10. 2 | 20. 2 | 30. 1 | 40. 4 |

11 පත්‍රය

01. 1. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය / වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය)

II. නීති සම්මත කිරීම/ මුදල් පාලනය/ විධායකය පාලනය කිරීම

III. පිහිටීම/ විවිධ ජාතීන් යෙළෙදාම සඳහා පැමිණීම/ ආක්‍රමණ/සංක්‍රමණ

IV. ප්‍රාග්ධන සූක්ෂම/ ශ්‍රම සූක්ෂම

V. මානවවාදී ගැටුම්/ යුධමය ගැටුම්

VI. දේශීය නීතිය/ අන්තර්ජාතික නීතිය

VII. ප්‍රාදේශීය සභා/ නගරසභා/මහනගරසභා

VIII. ජීව උපකාරක සේවා/ ආර්ථික උපකාරක සේවා/ අපද්‍රව්‍ය අවශෝෂණ සේවා

IX. රාජ්‍ය උපාය සම්බන්ධතා/ යුධ උපාය සම්බන්ධතා

X. ආරක්ෂාව/ පැවැත්ම/සංවර්ධනය/ සහාගීත්වය

02. 1. සිංහල/ ශ්‍රී ලංකා දෙමල/ ඉන්දියානු දෙමල/ ශ්‍රී ලංකා යෝනක (ල. 2)

II. ටී,බී.ටයිලර්/ චාර්ල්ස් ඒ එල්වුඩ්/ ඊ.ටී.හීලර් (ල. 3)

III. ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වීම/ ගැටුම් අවම වීම ..... ආදී කරුණු (ල. 5)

03. 1. සියරාලියෝන්/ඉතියෝපියාව/සෝමාලියාව/ බංගලාදේශය/....... ආදී (ල.2)

II. අවම කිරීම/ නැවත භාවිතය/ ප්‍රතිචක්‍රීකරණය (ල. 3)

III. (A) සමාජීය අවශ්‍යතා/ පරිසර සංවර්ධනය/ ආර්ථික සංවර්ධනය (ල.3)

(B) පරිසර හිතකාමී සම්පත් පරිහරණය/ සෞන්දර්යාත්මක බව රැක ගැනීම (ල. 2)

04. 1. පුද්ගයාතුල/ පුද්ගලයන් අතර/ ජන කණ්ඩායම් අතර/ රටවල් අතර (ල. 2)

II. දේශපාලනය/ සමාජ ආර්ථික තත්ත්වය/ ආගමික මතවාද (ල. 3)

III. (A) පවුල් ආවුල්/ සේව්‍ය සේවක ආරවුල්/ අසල්වැසි ආරවුල් ආදී (ල. 3)

(B) මඟපෙන්වීම් ලබා දීම/ විකල්ප විසඳුම් පෙන්වා දීම...... ආදී (ල. 2)

05. 1. මහා බ්‍රිතාන්‍යය/ ඇමරිකා එක්සත් ජනපදය/ (ල. 2)

II. ජාතික ඒක්‍රාග්‍රතාවය/ යුධ හා නාවික ශක්තිය/ දියුණු ආර්ථික තත්ත්වය (ල.3)

III. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම/ නීතියේ ආධිපත්‍ය පැවතීම/ අධිකරණයේ ස්වාධීනත්වය (ල. 5)

06. 1. ආර්ථික භාණ්ඩ/ ආර්ථික නොවන භාණ්ඩ (ල. 2)

II. දේපල අයිතිය රජය සතු වීම/ මාධ්‍ය සැළසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙය වීම/ (ල. 3)

III. (A) පාරිභෝගික භාණ්ඩ/ අන්තර් භාණ්ඩ/ ප්‍රාග්ධන භාණ්ඩ (ල. 3)

(B) ආර්ථිකය අර්ධ ස්වරූපයක් පැවතීම/ විනිමය නීති ලිහිල් කිරීම/ ආහාර සහනාධාරය අඩු කිරීම (ල. 2)

07. 1. ගිනිකඳු පිපිරීම/ ලැව්ගිනි ඇතිවීම/ දූවිලි කුණාටු (ල. 2)

II. පරිසරය දූෂණය/ බලශක්ති අර්බුදය ..... ආදී (ල. 3)

III. ගෝලීය උණුසුම් වීම/ කාළගුණ රටාවේ වෙනස්කම්/පසේ සරුබව නැතිවීම ....ආදී (ල. 5)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**